**රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදල - 2012**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 2.1(ඇ) ජේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 අගෝස්තු 03 දින අත්සන් තැබුණු භාර අරමුදලේ ප්‍රතිඥා පත්‍රයේ 12 වන වගන්තියේ (අ) ජේදය අනුව භාර මණ්ඩලය අවම වශයෙන් මාස 3 කට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් පවත්වා නොතිබුණි.

(ආ) 2006 ජුනි 27 දිනැති අවබෝධතා ගිවිසුමේ (MOU) විෂය 06 ට අනුව, භාර අරමුදලට සහභාගීවන එක් එක් රාජ්‍ය ආයතන විසින් අවම වශයෙන් මාස 6 ක ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහ විස්තර අරමුදල් කළමනාකරු වෙත සැපයිය යුතු යැයි ඉල්ලීම් කළ යුතු වේ. එහෙත් එවැනි ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහයන් සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් කළමනාකරු වෙත ලැබී නොතිබුණි.

(ඇ) භාර ඔප්පුවේ විෂය 07 අනුව, අරමුදල් කළමනාකරුට දැන්වීමක් කිරීම මගින් ඕනෑම අවස්ථාවකදී ආයෝජනය කරන ලද මුළු මුදල පොලිය සමඟ භාර අරමුදලින් ආපසු ගැනීමට හිමිකම් ලබන රාජ්‍ය ආයතන දක්වා ඇත. භාර ඔප්පුවේ විෂය 17 අනුව ගෙවීම

සඳහා ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් දින 10 ක් ඇතුළත භාර ප්‍රතිලාභීන් ඔවුන්ගේ අරමුදල් ආපසු ලබාගැනීමට හිමිකම් ලබයි. කෙසේ වුවද රු.බිලියන 10.7 ක් මාරු කිරීම හේතුවෙන් භාණ්ඩාගාරය විසින් ආපසු ගැනීම් අරමුදල් භාර අරමුදලට නොගෙවුවහොත් ප්‍රතිලාභින්ට කිසිඳු අරමුදලක් ආපසු ගැනීමට නොහැකි වනු ඇත.

**2.** **මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය**

**2.1** **මුල්‍ය කාර්ය සාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ භාර අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය ලාභාංශවලට පෙර රු.මිලියන 1,113.4 ක ශුද්ධ ආදායමක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභාංශවලට පෙර ශුද්ධ ආදායම රු.මිලියන 1,457.5 ක් වුයෙන් මුල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 344.1 ක එනම් සියයට 24 ක අඩුවීමක් දැක්වුණි. ඒකාබද්ධ අරමුදලට ගෙවීම් කිරීම සඳහා තැන්පතු කල් පිරීමට පෙර ආපසු ගැනීම් හේතුවෙන් ප්‍රාග්ධන ලාභ හා පොලී ආදායම අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභින් 3 දෙනෙකු පමණක් රු.මිලියන 1,258.9 ක් භාර අරමුදලේ තැන්පත් කර තිබුණු අතර, ප්‍රතිලාභින් 6 දෙනෙකු රු.මිලියන 1,843.4 ක මුදලක් ආපසු ගැනීම් කර තිබුණි.

(ඇ) 2012 නොවැම්බර් මාසයේදී ප්‍රතිලාභින්ගේ ආයෝජනවලින් සියයට 94 ක් (රු.බිලියන 10.70 ක් ) ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2012 ජනවාරි 01 දිනට පැවති රු.බිලියන 11.79 ක් වූ අරමුදල් පදනම 2012 දෙසැම්බර් 31 රු.බිලියන 1.58 ක් දක්වා බාදනය වී තිබුණි. මෙය භාර අරමුදලේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපා තිබුණි.

(ඈ) භාර අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන ආයෝජන ශේෂය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 10.98 කින් අඩුවී තිබුණි.

**3. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ප්‍රක්ෂේපිත අරමුදල් ප්‍රවාහ විස්තර ඉදිරිපත් කිරීම.

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය

(ඇ) ආපසු ගැනීම සඳහා භාරකරුවන්ගේ අනුමැතිය

(ඈ) භාරකරුවන්ගේ රැස්වීම් ක්‍රමවත්ව පැවැත්වීම

(ඉ) ප්‍රතිලාභින් සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත රඳවා ගත් අතිරික්ත අරමුදල් සමාලෝචනය කිරීම

(ඊ) ලාභාංශ බෙදාදීම

(උ) අරමුදල් මාරු කිරීම් සඳහා ප්‍රතිලාභින්ගේ අවධානය ලබාගැනීම